**සීමාසහිත පීපල්ස් ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම - 2016/ 2017**

**---------------------------------------------------------------------**

සීමාසහිත පීපල්ස් ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගමේ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මණ්ඩලයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

**----------------**

## 2.1 මතය

**--------**

මූල්‍ය ප්‍රකාශනවලින්, 2017 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය මගින් අවශ්‍ය වන පරිදි, පහත කරුණු දක්වමි.

(අ) විගණනයෙහි මතය සඳහා පදනම හා විෂය පථය සහ සීමාවන් ඉහත දක්වන පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවන්ට අනුකූල වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ, සමාගම විසින් ආදායම් ජනනය කිරීමේ සියළුම මාර්ග දැක්වීම සිදු කිරීම කළ යුතුය. කෙසේ වුවද, හෝටල් වෙන්කිරීම, වීසා බලපත්‍ර හා මුදල් ආපසු ගෙවීම් මගින් ඉපැයූ ආදායම් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ සඳහන් කර නොතිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහතින් දැක්වෙන අයිතමයන්ට ඉදිරියෙන් දක්වා ඇති ලේඛනමය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් අයිතම | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ණයගැතියන් | 64,445,735 | ශේෂ සනාථ කිරීම් |
| කුලී වියදම් | 65,000 | ගිවිසුම |
| විදේශ ගමන් වියදම් | 171,635 | වියදම් තහවුරු කිරීමට අදාළ වැඩසටහනේ උපලේඛන, ගුවන් ටිකට්පත්, විදේශ ගමන් බලපත්‍ර හා සහභාගී වීමට අදාළ තොරතුරුවල ඡායාපිටපත් ආදී ලේඛන |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාගමේ ණය ප්‍රතිපත්තිය අනුව, ණයගැති ණය කාලය දින 15 කි. කෙසේ වුවද, සේවක ණයගැතියන් රු.2,598,070 ක් හා සමූපකාර ණයගැතියන් රු.3,429,979 ක් මාසයකට අධික කාලයක සිට අයකර ගැනීමකින් තොරව හිඟ හිටව පැවතුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

-----------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | |
| (i) 117 වගන්තිය | අධ්‍යක්ෂ ගාස්තු සඳහා වන උපයන විට ගෙවීමේ බදු (PAYE) රු.11,000 ක් සමාගම විසින් අඩු කරගෙන නොතිබුණි. |
| (ii) 114 වගන්තිය | (i) උපයන විට ගෙවීමේ බදු (PAYE) අඩුකිරීම් සඳහා නොකඩවා ගෙවන ප්‍රවාහන දීමනා සැලකිල්ලට ගෙන නොතිබුණි. |
| | (ii) පනතෙහි විධිවිධාන ප්‍රකාරව, ප්‍රසාද දීමනා ගෙවීම් සැලකිල්ලට ගනු ලබන්නේ සම්පූර්ණ ගෙවීමක් වශයෙන් වන හෙයින් උපයන විට ගෙවීම් බදු (PAYE) ද ඒ ආකාරයෙන් අඩුකළ යුතුය. කෙසේ වුවද, සමාගම විසින් මෙයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු පනත මඟින් සංශෝධිත (සංශෝධන) 2008 අංක 10 සහ 2011 අංක 13 දරන පනත් | රු.25,000 ට වැඩි මුදල් හෝ වෙනත් දේපල ලැබීමක් හෝ මුදාහැරීමක් සිදුකිරීමේදී රු.25 ක ගාස්තුවක් අයකළ යුතුය. එසේ වුවද, මුද්දර ගාස්තු සඳහා අඩුකිරීමේදී සමාගම විසින් අදාළ සියළුම ලැබීම් සහ මුදාහැරීම් සැලකිල්ලට ගෙන නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

-------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාගමේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.15,479,011 ක බදු පෙර ලාභයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ බදු පෙර ලාභය වූ රු.13,462,229 ක සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල රු.2,016,782 ක හෝ සියයට 14.98 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. හෝටල් වෙන්කිරීමේ ගාස්තු සහ වෙනත් සංචාර සහ පොලී ආදායම් රු.2,198,444 කින් හෙවත් සියයට 15.07 කින් ආදායම ඉහළ යාම මෙකී මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ සමාගමේ ඇතැම් වැදගත් අනුපාත ඉකුත් වර්ෂ 04 සමඟ සසඳා පහත දැක්වේ.

| අනුපාත | 2016/2017 | 2015/2016 | 2014/2015 | 2013/2014 | 2012/2013 |
|---|---|---|---|---|---|
| **ලාභදායීත්ව අනුපාත (සියයට)** | | | | | |
| ශුද්ධ ලාභ අනුපාතය (NP Ratio) | 26.67 | 24.64 | 22.83 | 25.45 | 27.04 |
| මුළු වත්කම්වලට ප්‍රතිලාභ (ROA) | 9.13 | 9.43 | 10.24 | 11.89 | 9.76 |
| ස්කන්ධයට ප්‍රතිලාභ (ROE) | 17.94 | 18.51 | 19.19 | 22.90 | 21.79 |
| **ක්‍රියාකාරී අනුපාතය** | | | | | |
| ණයගැති පිරිවැටුම් අනුපාතය (වාර ගණන) | 0.77 | 1.02 | 1.05 | 1.15 | 1.10 |
| **ද්‍රවශීල අනුපාතය** | | | | | |
| ජංගම අනුපාතය (වාර ගණන) | 1.47 | 1.38 | 1.45 | 1.44 | 1.13 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ ද්‍රවශීලතා අනුපාතය, පසුගිය වර්ෂ 4 දී සම්මත අනුපාතය වන 2 ක් පවතින වඩාත් පිළිගත් යහපත් කාරක ප්‍රාග්ධන කළමනාකරණයක් සහිත ආයතනයකට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ආ) 2012/2013 වර්ෂයේදී 1.10 ක්ව පැවැති ණයගැති පිරිවැටුම් අනුපාතය 2016/ 2017 වර්ෂයේදී 0.77 ක් දක්වා පහත වැටී තිබුණි. මෙය දුර්වල ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය මෙන්ම සමාගමේ අයහපත් ණය ප්‍රතිපත්තිය මනාව පිළිඹිබු කරයි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සංචාරක නියෝජිතයෙක් වශයෙන් සහ කොමිස් නියෝජිතයෙක් වශයෙන් ව්‍යාපාර කටයුතු සිදුකිරීම සමාගමේ ප්‍රධාන අරමුණ වේ. කෙසේ වෙතත්, 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සහ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද, සමාගම විසින් වාර්ෂික ඉලක්කයන් සඳහා වන ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් (KPI's) පිළියෙල කර නොතිබුණි. මේ අනුව අපේක්ෂිත ඉලක්ක සමඟ සසඳා සමාගමේ තථ්‍ය කාර්යසාධනය තක්සේරු කිරීමට නොහැකි වී තිබුණි.

## 4.2 කළමනාකරණ දුර්වලතා

### 4.2.1 රාජ්‍ය ආයතනවලින් වන හිඟ ණය

මුළු වෙළඳ ණයගැති ශේෂය වන රු.69,779,197 න් රු.57,361,326 ක් හෙවත් සියයට 82 ක් රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු ණය විය. සමාගමේ ණය ප්‍රතිපත්තිය අනුව, එම ආයතනවලට ලබාදී ඇති ණය කාලය දින 15 කි. කෙසේ වුවද, මෙම ආයතනවලින් අයවිය යුතු මුළු ශේෂයෙන් රු.5,182,959 ක් හෙවත් සියයට 9 ක් සඳහා ලබාදී ඇති ණය කාලය දින 90 ද ඉක්මවා තිබුණි. සමාගම විසින් දිගුකාලීනව අයවිය යුතු ණය අයකර ගැනීම සඳහා කාර්යක්ෂමව කටයුතු කර නොතිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

### 4.2.2 ආදායම

සංචාරක ලාභ සමාගමේ ප්‍රධාන ආදායම් උත්පාදකය වුවත්, පහත සඳහන් සංචාර මඟින් සමාලෝචිත වර්ෂයේදී සමාගමට රු.1,305,914 ක අලාභයක් ලබා තිබුණි. විස්තර පහත දැක්වේ.

| සංචාරය | කාලය | අලාභයේ වටිනාකම |
|---|---|---|
| | | රු. |
| CLT 205 – UK | 30/07/2016 - 22/07/2016 | 1,274,474 |
| CLT 216-DAM | 12/10/2016 - 22/10/2016 | 31,440 |
| | | 1,305,914 |

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 විගණන කමිටු

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

### 5.2 අයවැය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම් අතර සමාලෝචිත වර්ෂයේදී සියයට 7 සිට සියයට 21 ක් දක්වා වූ සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ අතර අයවැය කාර්යක්ෂම කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව පැහැදිලි විය.

## 6. පද්ධති හා පාලන

අනාවරණය වූ සමාගමේ පද්ධති හා පාලන දුර්වලතාවයන් සමාගම් සභාපතිවරයාගේ අවධානය සඳහා කලින් කළ දැනුවත් කරන ලදී. පහත සඳහන් විශේෂ අවධානය යොමු කළ යුතු පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | එකිනෙක සංචාරවල ලාභ හෝ පාඩු ගණනය කිරීම සඳහා වෙන වෙනම ලෙජර් ගිණුම් පවත්වාගෙන යන නමුත්, ඇතැම් අවස්ථාවල දී අදාළ සංචාර ගිණුම්වල සිදුවූ අලාභ මඟහැරීම සඳහා ජංගම බැරකම් සංචාර ගිණුම්වලට ජ'නල් සටහන් යොදා තිබුණු බව නිරීක්ෂණය විය.<br><br>සමාගමේ වගකිව යුතු නිලධාරියෙකු විසින් සමාගමේ ජර්නල් සටහන් යෙදීම අනුමත කර නොතිබුණි. එම නිසා, ජර්නල් සටහන් යෙදීමේ ද්විත්ව පාලන පද්ධතියක් සිදු නොවීය. |
| (ආ) | සංචාර | සමාගම විසින් සෑම සංචාරයක් සඳහාම වෙනම ලිපිගොනුවක් පවත්වාගෙන යනු ලැබුවත්, එම ලිපිගොනුවල සංචාරය සඳහා අනුමත අයවැය, පාරිභෝගිකයින්ගේ අවසන් ලැයිස්තුව, අදාල ලේඛනවල පිටපත් ආදී අවශ්‍ය සෑම ලේඛනයක්ම ලිපිගොනුවේ ඇතුළත්ව නොතිබුණි. තවද, ලිපිගොනුව නිසි පරිදි අංකනය කර නොතිබුණි. |
| (ඇ) | වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | ලැබිය යුතු ශේෂ එකිනෙක පාරිභෝගිකයාගේ නමින් පවත්වාගෙන යනු ලැබීම වෙනුවට සමාගම විසින් පාරිභෝගිකයින් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන සේවකයින්ගේ නමින් ශේෂ දැක්වෙන ලේඛනයක් පවත්වාගෙන ගොස් තිබුණි. |
| (ඇ) | මුදල් හා මුදල් සමාන දෑ | අතැති මුදල් සඳහා වන මුදල් ගිණුම (BAOO5) රැස්කිරීමේ ගිණුමක් වන අතර, දෛනික රැස්කිරීම් මහජන බැංකුවේ Queens ශාඛාවේ අදාල දිනය අවසානයේ තැන්පත් කරනු ලබන අතර, ප.ව. 3.00 න් පසුව වන රැස්කිරීම් ඊළඟ දිනයේ තැන්පත් කරනු ලබයි. කෙසේ වුවද, දින එකක සිට දින 2 ක් දක්වා එදිනම බැංකුගත නොකර මුදල් අතෙහි රඳවා ගෙන තිබුණු බව ඇතැම් අවස්ථාවලදී නිරීක්ෂණය විය. |